# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVIII | YEAR OF OUR LORD JESUS CHRIST, 2024 MAY | Issue No. 06


## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 75:1 - 9)**

01. දෙවියන්වහන්ස, අපි ඔබට ස්තුති කරමුව; ඔබගේ නාමය සමීප බැවින් ස්තුති කරමුව. මනුෂ්‍යයෝ ඔබගේ පුදුම ක්‍රියා ප්‍රකාශකරති.

02. නියම කාලය ලැබූ කල මම අවංකලෙස විනිශ්චයකරන්නෙමි.

03. පොළොවද එහි සියලු වැසියෝද දියව ගියෝය. මම ඒකේ ටැම් සිටුවීමි.

04. අහංකාරලෙස ක්‍රියා නොකරව්යයි අහංකාරීන්ටත් අඟ උසස් නොකරව්යයි දුෂ්ටයන්ටත් කීමි.

05. ඔබ සැමගේ අඟ උස් නොකරව්; තද කුළල් ඇතිව කථා නොකරව්.

06. මක්නිසාද උසස්කම නැගෙනහිරින්වත් බස්නාහිරින්වත් දකුණෙන්වත් නොවන්නේය.

07. නුමුත් දෙවියන්වහන්සේ විනිශ්චය කාරයාණෝය. උන්වහන්සේ එක්කෙනෙකු පහත් කරනසේක, අනිකෙකු උසස් කරනසේක.

08. මක්නිසාද ස්වාමීන්ගේ අතේ කුසලානක් ඇත, එහි මුද්‍රිකපානය පෙණ දමයි; එය මිශ්‍ර ද්‍රව්‍යයෙන් පිරී තිබේ, උන්වහන්සේ එයින් වත්කරනසේක. සැබවින් පොළොවේ සියලු දුෂ්ටයෝ එහි මණ්ඩි මිරිකා බොන්නෝය.

09. එහෙත් මම සදාකල් ප්‍රකාශ කරන්නෙමි, යාකොබ්ගේ දෙවියන්වහන්සේට ප්‍රශංසා ගී කියන්නෙමි.

## අපගේ ස්වාමීන්වහන්සේගේ මාතෘ හදවත !



*''මනුෂ්‍යයෙකු තමාගේ මවු විසින් සනසනු ලබන්නාක් මෙන් මම නුඹලා සනසන්නෙමි...''*

(ප්‍රධාන කර්තෘ දේවගැති ඇන්ඩලින් සෙල්වකුමාරි)

ගැලවුම්කාර ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් ඔබට ආසිරි පතමි. උන්වහන්සේගේ දයාව කරණකොටගෙන ස්වර්ගීය ආශිර්වාදයන්ගෙන් අපට ආශිර්වාද කර තිබේ. මෙම මාසය ඉතාම වැදගත්වූ මාසයකි. මන්ද මෙම මාසය මුළු ලෝකයම මවුවරුන්ගේ දිනය සමරනවා ඇත. එබැවින් කැඳවීමේ ප්‍රතිරාවය සේවය තුළින් සියලුම මව්වරුන්ට සුභ පැතුම් ගෙනෙමි. සමහර මව්වරුන්ට මේ දිනය ඉතා ප්‍රීතිමත් වූ දිනයක් වුවත් තවත් සමහර මව්වරුන්ට මෙය ඉතා දුක්බරවූ දිනයක්ව ඇත. සමහර විට මෙම පණිවිඩය කියවීමට පෙර 'මා මවෙක් නොවෙයි' කියා ඔබ සිතමින් මෙය කියවීමට අවශ්‍ය නොමැත කියා සිතන්නට පුළුවන. මව්වරුන්ගේ දිනය යනු, මවකගේ සැලකීමත් මවකගේ සොයා බැලීමේ හදවත ගැන සිතීමත්ය. සහෝදරයෙක්, මාමා කෙනෙක් සහෝදරියක්,

3 වෙනි පිටුවට ...




**Echo of His Call**

*Christian YouTube Channel!*

**An opportunity to pray with Pr. S. Sam Selva Raj!**

Message & Prayer in 5 minutes!!

**English, Hindi, Tamil & Telugu**

Every day – From 2.00 A.M.

**Tamil Sunday Service – 8.30 A.M.**

# ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)



REACHING NATIONS

## *from your dearly beloved brother...*



**"නමුත් ධර්මිෂ්ඨයන්ගේ ගැලවීම ස්වාමීන්ගෙන්ය. විපත්ති කාලයේදී උන්වහන්සේ ඔවුන්ගේ බලකොටුව වනසේක." (ගීතාවලිය 37:39)**

### OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
HON. MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Sis. L. Mariya Anjalin, M.A., M.Sc., B.Ed.
Rev. Dr. K.R. Rajasekaran
EDITOR, PUBLISHER & PRINTER

Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95561 31858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

**ක්‍රිස්තුස්වහන්සේ තුල ප්‍රේමවන්තයෙනි,**

අප වෙනුනේ ඔබ කරන්නාවූ නොකඩවා යාච්ඤාව නිසාත් ඔබගේ ස්ථිරවූ උදවු උපකාරයන් නිසාත් අපගේ හෘර්දයාන්ගයෙන්ම නැගෙන ස්තුතිය අප ඔබට පුද කරමු. උන්වහන්සේගේ සේවයට ඔබ දක්වන ඔබගේ කැපවීමට උන්වහන්සේ ඔබට මහත් ලෙස ආශිර්වාද කරන සේක.

අප්‍රේල් මාසයේ තුන්වන සතියේදී අප දරුවන් උදෙසා නිවාඩු කාලීන බයිබල් පාසල පැවැත්වූවෙමි. එය ඉතා සාර්ථකව කරගෙන යාමට දෙවියන්වහන්සේගේ මහත් වූ කරුණාව අපට ලැබුණි. චෙන්නෙයි පලාතේ සිටි අසල්වාසීන්ගේ දරුවන් සියගණනක්ද චේපාක්, වේලච්චේරි, බාලාජිනගර්, සහ සදෝශපුරම් යන පළාත්වල සිටින බොහෝ දරුවන්ද මෙයට සහභාගී විය. අප මෙම දවරුන්ට දේව වචනය ඉන්වුවෙමි. මෙම සේවයෙහි යෙදුනාවූ සෑම දේව දාසයින්ටම අපි ඉතාම ස්තුති වන්ත වෙමු.

පාස්ටර් සෑම් සේලව රාජ්ගේ ජීවිත කථා පොත එළිදැක්වීමට සියලු කටයුතු අප දැන් සූදානම් කරනගෙන යන්නෙමු. මෙම සේවය තුළින් ඔබටත් කිසියම් සාක්ෂියක් තිබේ නම් එය වාක්‍ය 10 කින් පමණ ලියා අප වෙතට එවන්න. ඔහුගේ සේවය තුළින් ඔබ ලබාගත් ආශිර්වාදය ඡායා රූපයක් සමඟ අප වෙතට එවුවා නම්, එය මෙම පොතට ඇතුලත් කිරීමට අපට හැකිය.



*Pr. Sam Selva Raj's Autobiography Team*

අපගේ බයිබල් විදුහලෙහි ඉගෙන ගත්තාවූ උපාධිධාරීන් 50 දෙනෙකුට අප උදවු උපකාර කරමු. මේ අය ඉතා ඉක්මනින්ම සේවය සඳහා විවිධ පළාත් වලට යන්නට යනවා. එසේම උපාධි පිරිනැමීමේ උත්සවය 2024 ජූනි මස 01 වන දින පවත්වන්නෙමු. නෙහෙමියා බයිබල් විදුහලෙහි නව ශිෂ්‍යයින් උදෙසා

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) YouTube Ministry Online Courses Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development

පාඩම් මාලාවේ ආරම්භය 2024 ජූනි මස 03 වන දිනට පැවැත්වීමට නියමිතය.

නෙහෙමියා බයිබල් විදුහලෙහි හිංදි භාෂාව උගන්වන බැවින් එම භාෂාව ඉගෙන ගැනීමට කැමති අය ඉන්නවා නම් කරුණාකර අපට ලියා දන්වන්න. එසේම මෙම සේවය උදෙසා යාච්ඤා කරන්න. එසේම අපගේ ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසලටත් උසස් අධ්‍යාපන පාසලටත් ශිෂ්‍යයින්ගේ හා ගුරු මණ්ඩලයේ අවශ්‍යතාවයන් සපයන්නය කියා දෙවියන්වහන්සේට යාච්ඤා කරන්න.

අප මුහුණදෙනු ලබන්නාවූ සෑම අවස්ථාවන් බාධාවන් හා අභියෝගයන් මැද අපගේ සේවය වර්ධනය වන නිසා අප දෙවියන්වහන්සේට ස්තුති කරමු. මේ සියල්ලම සිදුවෙනු ලබන්නේ උන්වහන්සේගේ කරුණාව හා දයාවන් නිසාය.

අපගේ යාච්ඤාවන් වලදී අපි ඔබ උදෙසා යාච්ඤා කරමු. අපගේ ස්වාමීන්වහන්සේගේ අසීමිත කරුණාව ඔබ කෙරෙහි මහත් සේ වගුරනු ලැබේවා. ආමේන් !

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක
පාස්ටර් සෑම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සෑම්සන් සෑම්
(+91) 98412 71858 / 98410 71858,
E.mail : sam@echoofhiscall.org

***1 පිටුවෙන්....***

නැන්දා කෙනෙක් යන මේ සෑම කෙනෙකුටම මවකගේ වගකීම සහ එම හදවත තිබිය යුතුය. මෙවැනි දවසක ඔබගේ ත්‍යාගශීලී ප්‍රේමය ගැන ඔබට සිහි කිරීමට පුළුවනි.

## දෙවියන්වහන්සේගේ මාතෘ ප්‍රේමය !

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ත්‍යාගශීලී ප්‍රේමය නිසා කල්වාරි කුරුසියේදී උන්වහන්සේ තම ජීවිතය අප උදෙසා පූජා කරනු ලැබුවා. උන්වහන්සේ ආත්මාර්ථකාමී නොවී අපට ජීවිතය දෙන පිණිස උන්වහන්සේගේ ජීවිතය කල්වාරි කුරුසියේදී පූජා කලේය. දෙවියන්වහන්සේගේ හදවතේ තිබෙන ප්‍රේමය කරණකොට ගෙන අපව ආරක්ෂා කරමින්ද අපව විනයට පත්කරමින් හා අපව ගුණාත්මක තත්ත්වයට හැඩගසන බව අපි දනිමු.



***යෙසායා 66:13 හි*** දෙවියන් වහන්සේ අපව සනසන්නාවූ මවක් ලෙස හඳුන්වයි. තවද ***මතෙව් 23:37*** හි දෙවියන් වහන්සේගේ ප්‍රේමය මවකගේ ත්‍යාගශීලි ප්‍රේමයට සමාන කරනු ලබයි.

තවද එක් අතකින් දෙවියන්වහන්සේ අපට ඉතා විනයානුකූලව හා ඉතා දැඩිව ක්‍රියා කරනවාය කියා අපි සිතමු. නමුත් ස්වාමීන්වහන්සේ එසේ කිරීමට හේතුව නම්, උන්වහන්සේ අපිව උන්වහන්සේගේ කැමැත්තේ ආකාරයට හරිගැස්වීමටත් අපට කාරණා උගන්වන පිණිසත්ය. මවකගේ ප්‍රේමය කොන්දේසි විරහිත වෙයි. අපගේ සියලු අඩුපාඩුකම් වලින් අපව නිවැරදි කර සාදයි. අපට දඬුවම් නොදී අපව ගොඩනගයි.

මෙම විශේෂිත වූ දිනයේදී දෙවියන්වහන්සේ ඔබව සැබෑ මවෙක් ලෙස මාරු කර එසේම, ඔබ අන් අයට කොන්දේසි විරහිතව දයාවෙන් අනුකම්පාවෙන් යුතුව සලකමින් අන් අයගේ වැරදි හරිගස්සමින් දෙවියන්වහන්සේගේ ප්‍රේමය තුළින් ක්‍රියා කරන්නාවූ මවක් ලෙස ක්‍රියා කරයි කියා මා ප්‍රාර්ථනා කරමි.

## බයිබලයේ මව්වරුන් !

දෙවියන්වහන්සේගේ වචනය දෙස බලන විටදී එහි බොහෝ මව්වරුන් සිටින බව අපට දැකීමට හැකිය. ඔවුන්ගේ උසස් යහපත් වූ ක්‍රියාවන් කරණකොටගෙන සෑම ප්‍රශ්නකාරී හා අභියෝගමත් අවස්ථාවන් වලදී ඔවුන් තම පවුල

ගොඩනගාගත්තේය. මේ අය අතරින් කැපී පෙනෙන්නාවූ එක් චරිතයක් වන්නේ, හාගර්ය.

### (1). මේ හාගර් යනු කවුද?

බොහෝ දෙනෙක් හාගර්ව හඳුනන්නේ ඇගේ අවසන් දවස්වලදීය. නමුත් මෙම හාගර් ගැන ඔබට යමක් හඳුන්වාදීමට කැමැත්තෙමි. හාගර් යන නමෙහි අර්ථය නම්, 'අත්හරිනු ලැබූ' යන්නයි. එනම් පිළිගැනීමක් නොමැතිව හා බොහෝ විට සමච්චලයට ලක් තැනැත්තෙකි. ඇය මිසරයෙන් පැමිණි වහල් කාන්තාවකි. ඇය ආබ්‍රහම්ට හා සාරාට සේවය කළාය. ආබ්‍රහම්ට හා සාරාට දරුවන් සිටියේ නැත. හදිසියේම සාරා ආබ්‍රහම්ට හාගර්ව විවාහ කර දුන්නාය. ආබ්‍රහම් තුළින් ඇය ගර්භණීවූවාය. මේ අවස්ථාවේදී එම නිවසෙහි වැඩකාරියක්ව සිටි හාගර් එම නිවසේම දෙවෙනි ස්ථානය හිමි බලවත් කාන්තාවක් විය. ඇය ඉෂ්මායෙල් නමින් දරුවෙක්ව බිහි කළේය. දැන් හාගර්ට දරුවෙන් සිටින නිසා ඇට සාරාට වඩා වැදගත් තැනැත්තියක් කියා සිතුවේය. හාගර්ගේ ක්‍රියා කලාපය නිසා සාරා සහ හාගර් අතර තිබූ සම්බන්ධතාවයට පළුද්දක් ඇති වීමට හේතුවුවා. පසුව සාරාට ඊසාක් නමින් දරුවෙකු ලැබුණු පසු එම දරුවා තමාගේම දරුවා නිසා හාගර්ගේ දරුවාත් සමඟ තමාට තිබූ උරුමට බෙදා ගැනීමට ඇය කැමති වූයේ නැත. මේ නිසා හාගර්ව හා ඇගේ පුත්‍රයා වූ ඉෂ්මායෙල්ව නිවසින් පිටත්කර හරින ලෙසට සාරා ආබ්‍රහම්ට බල කළේය. හාගර් තමාගේ ස්වාමියා විසින් අත්හරිනු ලැබූ කාන්තාවක ලෙසට ඇය කාන්තාරයට ගියේය. ඇගේ නමෙහි තිබූ තේරුමට අනුව, තම පුත්‍රයාට එවැනි වූ තත්වයකට පත් නොවී යහපත් වූ තත්වයකට පත්වෙන්න ඕනි කියා ඇය ප්‍රාර්ථනා කළේය. ඇය, මවෙක් විසින් විඳිනු ලැබුවා වූ දුක හා වේදනාවන් තම දරුවන්ට නොදෙන පිණිස තීරණය කළා වූ මවෙකි.

### (2). නොකැමති සහභාගීත්වය - හාගර්

ආබ්‍රහම්ව විවාහ කරගන්නා විට කිසිවෙක් හාගර්ට උපදෙස් දුන්නේ නැත. තවද ඔහුගෙන් වෙන්වන විටදීද ඇයට කිසිම උදව්වක් කිසිවෙකුගෙන් ලැබුනේද නැත. ඇගේ ජීවිතය පුරාවටම ඇයගේ ජීවිතය වෙනුවෙන් තීරණ ගනු ලැබූයේ අන් අය විසිනි. ඇය එයට අකමැති වුවත් අකමැත්තෙන් හෝ එසේ කිරීමට ඇයට සිදු විය. අද අපගේ ජීවිත දෙස බලන විටදී අපගේ අකමැත්තෙන් කී දෙනෙක් අපගේ ජීවිත වලට සම්බන්ධ වෙනවාද? හාගර්ට කිසිම බලතලයක් නොතිබුණු නිසා ඇයගේ ජීවිතයම අකමැත්තෙන් හෝ අන් අයගේ බලපෑම් වලට යටත් වී ජීවත් වීමට සිදු විය. සමහර විට කාන්තාවෙක් ලෙස ''මගේ ජීවිතයේ සියලු තීරණ ගනු ලබන්නේ අන් අයයි, මගේ කැමැත්ත කුමක්ද කියා කිසිවෙකු අහන්නේ නැහැ, කිසිවෙක් මගේ ආශාවන් හා කැමැත්ත තේරුම්ගන්නේ නැහැ. දැන් මා ජීවත්වෙනු ලබන්නේ අන් අය මගේ ජීවිතයෙහි ගනු ලබන්නාවූ තීරණ තුළින්ය.'' කියා ඔබත් සිතනවා විය හැක.

නමුත් මිත්‍රවරුනි, දේව වචනයෙහි පවසනු ලබන්නේ, දෙවියන්වහන්සේව විශ්වාස කරන්නාවූ අයට සියල්ලම යහපත පිණිස සිදුවන බවයි. මෙය අපට තේරුම් ගැනීමට අසීරු වුවත් දෙවියන්වහන්සේගේ කැමැත්තෙන් තොරව කිසිම දෙයක් අපගේ ජීවිතයෙහි සිදුවෙන්නේ නැත. අපගේ ජීවිතයෙහි සිදුවෙන්නාවූ සෑම දේම උන්වහන්සේ අපගේ ජීවිතයෙහි යහපතට පෙරලන්නාවූ දෙවියන්වහන්සේයි. අපගේ ජීවිතයෙහි අප මුහුණ දෙනු ලබන්නාවූ සෑම දේම යහපත උදෙසා පෙරළීමට යේසුස් වහන්සේට පුළුවනි. අප උන්වහන්සේව මුළුමනින්ම විශ්වාස කරමින් ක්‍රියා කළ හොත් ඒ සෑම දේම උන්වහන්සේ අපගේ යහපතට හරවන්නේය.

*ගීතාවලිය 31:15* හි දෙවියන්වහන්සේ මෙසේ පවසයි. ***අපගේ අනාගතය දෙවියන්වහන්සේගේ හස්තයෙහි තිබෙයි*** කියාය. හාගර් කාන්තාරයෙහි සිටින විටදී අනාගතයේදී තමාට කුමක් සිදුවෙයිද කියා නොදැන සිටියේය. නමුත් දෙවියන්වහන්සේ සියල්ලම පාලනය කරනු ලැබුවේය. උන්වහන්සේ ඔබගේ සියලු මාර්ග වලදී ඔබට මගපෙන්වන සේක. උන්වහන්සේගේ දෑතට ඔබ භාරවෙන්න. හාගර් දෙවියන්වහන්සේට භාරවූවක් මෙන් ඔබත් උන්වහන්සේට භාර වෙන්න.

....*Contd. to page 6*

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**මැයි:19-** ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසල, නෙහෙමියා බයිබල් විදුහල හා තැපැල් මාර්ගික පාඩම් මාලාව නිසා ස්තුති කරන්න.

**මැයි:20-** සඟරාව පරිවර්ථනය කරන්නාවූ අය සහ සහකාර කර්තෘ, සම්බන්ධීකරන අය සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් නිසා ස්තුති කරන්න.

**මැයි:21-**අපගේ ප්‍රධාන පාලක තුමා සහ ඔහුගේ පවුලේ අයව සියලු නපුරෙන් ආරක්ෂා කරන නිසා ස්තුති කරන්න.

**මැයි:22**- අපගේ යාච්ඤා පංගුකාරයින්, උපකාර කරන්නාවූ අය ඇදහිල්ලේ පංගුකාරයින් ජීවිත කාලය පුරාවටම අප හා සම්බන්ධ සිටින්නාවූ සියලු දෙනා උදෙසා ස්තුති කරන්න.

**මැයි:23-** අපගේ බයිබල් පාඩම් මාලාවේ වර්ධනය නිසාත් දේව ධර්මාචාර්ය පාඩම් මාලාවන්හි වර්ධනය නිසාත් ස්තුති කරන්න.

**මැයි:24-** අපගේ සියලුම සේවාවන් වල අවශ්‍යතාවයන් උන්වහන්සේ සපයන නිසා ස්තුති කරන්න.

**මැයි:25-** අපගේ ප්‍රධාන සභාව සහ ශාඛා සභාවන් වල සිටින්නාවූ සියලුම සාමාජිකයින් නිසා ස්තුති කරන්න.

**මැයි:26-** යුද්ධය නිසා පීඩා විඳින්නාවූ රටවල් නිසාත් එහි ජීවත් වෙන්නාවූ අය නිසාත් ඔවුන්ගේ දේව ආරක්ෂාව නිසාත් ස්තුති කරන්න.

**මැයි:27-** සමාජයේ විවිධාකාරවූ සේවයන්හි යෙදී සිටින්නාවූ කාන්තාවන් නිසා ස්තුති කරන්න.

**මැයි:28-** අපගේ ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලට ඉතා හොඳ කිතුණු ගුරු මණ්ඩලයක් හා විදුහල්පති කෙනෙක් ලැබුන නිසා ස්තුති කරන්න.

**මැයි:29-** ප්‍රධාන සභාව හා ශාඛා සභාවන්ද ප්‍රධාන පාලක තුමා හා අනෙකුත් පාලකවරුන් නිසා ස්තුති කරන්න.

**මැයි:30-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයෙහි කටයුතු කරන්නාවූ සේවක මඩුල්ල සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් නිසා ස්තුති කරන්න.

**මැයි:31-** නෙහෙමියා බයිබල් විදුහලට ලබා දුන්නාවූ සෑම අලුත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් නිසා ස්තුති කරන්න.

**ජූනි:01-** අපගේ ශුභාරංචි පත්‍රිකා මුද්‍රණාලය හා එහි සිටින කාර්ය මණ්ඩලය නිසා ස්තුති කරන්න.

**ජූනි:02-** අපගේ විනාඩි පහක YouTube සේවය හරහා ආශිර්වාද ලැබුවාවූ අය නිසා ස්තුති කරන්න.

**ජූනි:03**- දේශපාලනික හා ආගමික හේතූන් නිසා පීඩා වලින් දුක් විඳින්නාවූ සේවකයින්ගේ ආරක්‍ෂාව නිසා ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ජූනි:04-** තරුණ තරුණියන් අතර සිදුවෙන්නාවූ ධාර්මික ක්‍රියාවන්, මිණීමැරීම් හා අඳුරු බලවේගයන් වලින් දෙවියන්වහන්සේ ඔවුන්ව නිදහස් කරමින් ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආලේපයෙන් පුරවන්නය කියා යාච්ඤා කරමු.

**ජූනි:05-** සෑම පවුලක් තුලම සමාදානය ඇති වෙන්නය කියා යාච්ඤා කරමු.

**ජූනි:06-** ලොව පුරා ව්‍යාප්තවී තිබෙන්නාවූ කිතුණු අධ්‍යාපනික සංවිධාන ගැන යාච්ඤා කරමු.

**ජූනි:07-** කිතුණුවන් දේව වචනය තුළ ජීවත්වීමත් දෙවියන්වහන්සේගේ ගුණාංග නිතරම ඔවුන් තුල පවතින්නය කියාත් යාච්ඤා කරමු.

**ජූනි:08-** අපගේ සේවය ව්‍යාප්තවීම උදෙසාත් මුළු ලෝකය පුරාම ශුභාරංචිය පැතිරෙන්න කියාත් යාච්ඤා කරමු.

**ජූනි:09-** අපගේ ප්‍රධාන පාලක තුමාගේ ජීවිත කථාපොත ඉක්මනින්ම එළිදැක්වීමට උපකාර කරන්නය කියා යාච්ඤා කරන්න.

**ජූනි:10-** සෑම සභාවකටම අවශ්‍ය දිව්‍යමය ආරක්ෂාව උදෙසා යාච්ඤා කරන්න.

**ජූනි:11-** ජාතීන් අතරේ ආර්ථික සංවර්ධනය ඇතිවෙන්නය කියා යාච්ඤා කරන්න.

**ජූනි:12-** ශුභාරංචිය නොගියාවූ ප්‍රදේශ වලට ශුභාරංචිය ගෙන යන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:13-** අපගේ මිෂනාරීවරුන් විවිධ පළාත්වල සේවයෙහි යෙදී සිටින නිසා ඔවුන් උදෙසා යාච්ඤා කරන්න.

**ජූනි:14-** සියලුම කිතුණු සංවිධාන වලට අවශ්‍ය ආරක්ෂාව දෙවියන්වහන්සේ ලබා දෙන්නය කියා යාච්ඤා කරන්න.

**ජූනි:15-** 2024 - 2025 යන වර්ෂය සඳහා අපගේ නෙහෙමියා බයිබල් විදුහලට ඇතුලත් වූ සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවක් උදෙසාම යාච්ඤා කරන්න.

**ජූනි:16-** 2024 - 2025 යන වර්ෂය සඳහා ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසලට ඇතුලත් වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් උදෙසා යාච්ඤා කරන්න.

**ජූනි:17-** අපට උදව් උපකාර කරන්නාවූ මිත්‍රයින් හා ඔවුන්ගේ පවුල් උදෙසා යාච්ඤා කරන්න.

**ජූනි:18 -** දේව රාජ්‍යය මුළු ලෝ තලයෙහිම ව්‍යාප්ත වීමට දිව්‍යමය දර්ශනයක් ඇතිව ක්‍රියා කිරීමට අවශ්‍ය කරුණාව ඉල්ලා යාච්ඤා කරන්න.

....Contd. from page 4

දේව වචනයෙහි මෙසේ සඳහන් කරයි. ***''ආබ්‍රහම් අලුයම නැගිට රොටී සහ වතුර භාජනයකුත් ගෙන හාගර්ගේ කරේ තබා දරුවාද ඇයට දී ඇයට යන්ට හැරියේය. ඇය පිටත්ව ගොස් බෙයර්-ෂෙබා නම් වනයෙහි මංමුළාවුවාය.'' (උත්පත්ති 21:14)*** ආබ්‍රහම් පොහොසත් මනුෂ්‍යයෙකු වුවත් වතුර ටිකක් හා කෑම ටිකක් පමණක් හාගර්ට දෙනු ලැබීය. ඔහුගේ අරමුණ පැහැදිලි නැති වුවත්, දෙවියන්වහන්සේ හාගර්ට සපයයි' කියා සිතන්නට ඇත.



Hagar with her son in the desert

හාගර් මේ අවස්ථාවේ දී තනි විය. මවෙක් ලෙස මෙම දරුවාව කාන්තාරයෙහි හදා වඩා ගන්නේ කෙසේදැයි කියා සිතමින් ඇය මවිතයට පත් විය. ඇය සතුව මුදල්ද නොතිබුණ නිසා ඈ මහත් අසීරු වූ තත්වයකට පත් විය. දේව වචනය මෙසේ පවසයි. ***''කුමක් හෙයින්ද නුඹේ ස්වාමිපුරුෂයා නම් නුඹේ මැවුම්කාරයාණෝය. උන්වහන්සේ ගේ නාමය සේනාවල ස්වාමීන්වහන්සේය. නුඹේ මිදුම්කාරයාණෝ ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනැන්වහන්සේය...'' (යෙසායා 54:5)*** මෙවැනි කාන්තාවන්ට දේව වචනයෙහි ඇති පොරොන්දුව නම්, ස්වාමීන්වහන්සේ ඔවුන්ට ස්වාමී පුරුෂයෙක් සහ සපයන්නාද, ධෛර්‍යවන්තවත් කරන්නාද වන බවයි.

### (3). හාගර් සහ ඇගේ පුත්‍රයා !



Hagar wept for her son

හාගර් සහ ඇගේ පුත්‍රයා ඉතා අසීරු තත්වයකට පත්විය. ඇගේ පුත්‍රයා වතුර නොමැතිව මැරෙන්නට යන අවස්ථාවේදී හාගර් එය ඇගේ ඇසින් දැකීමට අකමැති වූ නිසා මෙසේ පවසනු ලැබීය. ***''....මක්නිසාද දරුවාගේ මරණය මට නොපෙනේවයි ඈ කීවාය.'' (උත්පත්ති 21:16)***

ඇය ඇඬුවේය, ඇගේ දරුවාව බේරා ගැනීමට ඇයට මාර්ගයට තිබුනේ නැත. ඔබ ඉතාම ආශා කරන්නාවූ දේ ඔබ අතින් ගිලිහී යනවාට ඔබ කැමතිද? අද එදා සිටියේ එවැනි අඳුරු වූ මොහොතකය. එවිට අද දෙවියන්වහන්සේ වෙතට හැරී මොරගැසුවේය.

අද දවසේදී මව්වරුන් තම දරුවන්ගේ විනාශවීමක් නොදැක ඔවුන්ගේ ජීවිත වලට ආශිර්වාදය උරුම වන පිණිස උත්සාහ දැරීමත් ඔවුන් උදෙසා දෙවියන්වහන්සේට මොරගැසීමත් උදෙසා අපට දැකීමට හැකි ආදර්ශමත් මවෙක් ලෙසට හාගර්ව දැකීමට හැකිය.

## A. මවක් ඇගේ පුත්‍රයා උදෙසා දෙවියන්වහන්සේට නොකඩවා කන්නලව් කිරීම

### (01). මවක් හඬා වැළපෙන විට දී ඇගේ පුත්‍රයාගේ දැඩි අවශ්‍යතාවය දෙවියන්වහන්සේට දැනෙයි !

*උත්පත්ති 21:17* වන පදයෙහි, හාගර්ට හා දරුවාට වතුර නොමැති වූ විටදී හාගර් බොහෝ වේදනාවට පත් වූ බව සඳහන් කරයි. ඇගේ දරුවාට වතුර නොමැතිව මිය යනවා දැකීමට ඇය අකමැති විය. එසේම ඇගේ දරුවා ගැන ඇයට තිබූ බලාපොරොත්තුව, අනාගත සිහින යන මේ සියල්ලම ඇයට ලොකු තර්ජනයක් විය. එපමනක්ද නොව ඇය මෙසේ පවසනු ලැබීය.

***''ඔහු ඉදිරියෙන් ඈත්ව දුනුසැරයක් පමණ දුරින් හිඳගත්තේය. මක්නිසාද දරුවාගේ මරණය මට නොපෙනේවයි ඈ කීවාය. ඈ ඔහුට ඉදිරිපිටින් හිඳගෙන ශබ්ද නගා හැඬුවාය.'' (උත්පත්ති 21:16)***

මවක් මොරගසන විටදී, දෙවියන්වහන්සේ ඇගේ දරුවා ගැන බලයි. දෙවියන්වහන්සේ ඇගේ යාච්ඤාවට ඇහුම්කන්දීම පමණක් නොව,

උන්වහන්සේ ඔබගේ කඳුළුද දකී. *''මාගේ කඳුළු ඔබගේ භාජනයෙහි තැබුව මැනව.'' (ගීතාවලිය 56:8)* මවෙක් හඬමින් තමාගේ දරුවා ගැන කන්නලව් කරන විට ස්වාමීන්වහන්සේ ඒ කඳුළු දකී. තවද දේව වචනය පවසන්නාවූ ආකාරයට හාගර්ගේ පමණක් නොව දරුවාගේ හඬත් දෙවියන්වහන්සේ වෙතට පැමිණුනේය කියා හාගර්ගේ මොරගැසීම පමණක් නොව ඉෂ්මායෙල්ගේ නිහඬ කඳුළුත් උන්වහන්සේ දුටුවේය.

ඔබ කුමන හෝ හේතුවක් නිසා ඔබගේ දරුවා ගැන හඬමින් කන්නලව් කරන විටදී ස්වාමීන්වහන්සේට ඔබගේ දරුවාගේ අවශ්‍යතාවය සැපයීමට පුළුවනි. කුරුසිපත් වී මළවුන්ගෙන් නැගිටුනාවූ අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදත් ඔබගේ, කඳුළු පිසදැමීමට සූදානම්ව සිටී.

(b). **මවක් හඬාවැටෙන විටදී, ඈ ඇගේ දරුවාගේ ස්ථානයෙහි සිටගනී.**

හාගර් තමාගේ පුත්‍රයාගේ ස්ථානයෙහි සිටගෙන ඔහුගේ ශක්තිය අඩු වූ කල්හි ඈ දෙවියන්වහන්සේ ඉදිරියෙහි සිටගත්තේය. තමාගේ දරුවාගේ අනාගතය ගැනත් එම දරුවාගේ ජීවිතය ගැනත් මවක් හැටියට හාගර් දෙවියන්වහන්සේ ඉදිරියෙහි සිටගෙන කන්නලව් කලේය.

අපත් යහපත් මව්වරුන් හැටියට අපගේ දරුවන් උදෙසා ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි සිටගැනීමට අවශ්‍ය වෙයි. සමහර විට ඔබට දියණියක් හෝ පුතෙක් සිටිනවා විය හැකිය. සමහර විට ඔවුන් මානසික ආතතියෙන් පෙළෙනවා විය හැක. ඔවුන් උදෙසා කඩුල්ලේ සිටගැනීමට ඔබට පුළුවන. ඔබ කඩුල්ලේ සිටගන්නාවූ මවක් නම්, ඔබ නොකඩවාම යාච්ඤා කරන්නාවූ මවෙක් වෙනු ඇත. ඔවුන්ගේ ශාරීරික හා ආත්මික ආශිර්වාද වෙනුවෙන් මව්වරුන් වන ඔබ සිටගත යුතුයි.

මවෙක් කන්නලව් කරන විටදී දෙවියන්වහන්සේ එයට පිළිතුරු දෙයි.

අපගේ දරුවන්ට යහපත් වූ අනාගතයකට අවශ්‍යය ආශිර්වාද සෙවීම අපගේ යුතුකමකි. මව්වරුනි, ඔබගේ හඬ ඔසවා ඔබගේ දරු මුණුබුරන් උදෙසා යාච්ඤා කරන්න.

නුඹේ සියලුම දරුවෝද ස්වාමීන්වහන්සේ විසින් උගන්වනු ලබන්නෝ වෙති, නුඹේ දරුවන්ගේ සමාදානයද මහත්වන්නේය.'' (යෙසායා 54:13)

(C). **මවෙක් යාච්ඤා කරන විටදී, දෙවියන්වහන්සේ ඇගේ පුත්‍රයාට ආශිර්වාද කරමින් ඔහුගේ අනාගතය එළිදරව් කරයි. (උත්පත්ති 21:18 - 20)**



Hagar's son



Angel of God spoke to Hagar

....Contd. to page 10


## NEHEMIAH BIBLE COLLEGE

## Graduation Service, 2023-2024

Venue : BKN Hall, Vepery, Chennai – 07.
Date : 1st June, 2024 (Saturday)
Time : 5.00 P.M.





About 50 students will complete their studies and will be sent to the mission field.

We need 75 students for the Tamil and Hindi courses for the academic year 2024-2025. Please pray for this request. Admissions are going on for the next academic year 2024-2025.



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**"...කියවන්නා තේරුම් ගනීවා...."** *(මතෙව් 24:15)*

## යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙන් මිතුරෙක් අපට සිටී !

*''මාගේ මිදුම්කාරයාණන් ජීවත්ව සිටින බවද....'' (යෝබ් 19:25)*

මාගේ සේවය මුල් කාලයේදී මා ඉතාම පීඩා සහ අමාරුකම් තුළින් ගමන කලෙමි. බොහෝ ආර්ථික ප්‍රශ්න මා පිට ඉතා බරව තිබුණි. මාගේ කාර්යාලය සහ සේවා ස්ථානය පවත්වාගෙන යාමට ස්ථිර තැනක් නොතිබුන නිසා එය තැනින් තැනට මාරු කිරීමට සිදු විය.

1980 වන වර්ෂයේදී දිනක් මා ඉතා අසීරු වූ තත්වයකට පත්වුනෙමි. මට ඉතා භයානක උණ රෝගයක් වැළඳී මගේ මුළු ශරීරයම වේදනාවට පත්විය. එසේම මගේ බෙල්ලෙහි මහත් වේදනාවක් හා කැක්කුමක්ද ඇති විය. මා සෑම අතින්ම තනි විය. මේ අමාරු වේලාවේදී මා මගේ මිතුරෙකු වෙතට ගොස් ඔහු සමඟ දිනක් නැවතීමට මා ඉල්ලුවෙමි. කලින් මා ඔහුට උදවු උපකාර කල මුත් මේ අවස්ථාවේදී ඔහු මට උදව් නොකර මාව භාර ගැනීමට නොහැකිය කියා පැවසීය. මා මහත් වූ වේදනාවක් සහිතව තනිවී සිටියෙමි.

පසුදින උදෑසන මා ගැන අනුකම්පා වූ අයෙක් මාව රජයේ රෝහලට ඇතුලත් කලෙමි. ඒ රෝහල තුලදී ද මාව තනි විය. මා හට උදවු උපකාර කිරීමට කිසිවෙක් සිටියේ නැත. දින ගණනාවක්ම මා මේ ආකාරයෙන් රෝහල තුල සිටියෙමි. වෛද්‍යවරුන් මා හට ශල්‍යකර්මයක් කිරීමට අවශ්‍යයි කියා පැවසුවත් ඒ සඳහා මට දිනයක් ලැබුනේ නැත. එවිට මා මගේ හදවතින් දෙවියන්වහන්සේට කන්නලව් කරමින්, 'ලෝකයෙහි මට උපකාර කිරීමට කිසිවෙක් නැහැ. මේ සේවයේදීත් මා හට උපකාර කිරීමට කිසිවෙක් නැහැ' කියා පැවසුවෙමි. *''මාගේ මාර්ග කියාදුනිමි. ඔබ මට උත්තරදුන්සේක....'' (ගීතාවලිය 119:26)*



*Divine touch of Jesus Christ!*

දිනක් රාත්‍රියේදී මා තනිකමෙන් හා වේදනාවෙන් සිටින විට මා නොකඩවාම යාච්ඤාවෙන් සිටියෙමි. එවිට දෙවියන්වහන්සේගේ හස්තයෙන් මට අත ගසන බව දැනුනි. පසුදින උදෑසන මෙම අත්දැකීම මා වෛද්‍යවරයා සමඟ බෙදා ගත්තෙමි. එවිට ඔහු මට මෙසේ පවසනු ලැබීය. ''මට තේරුනා බොහෝ ක්‍රිස්තියානි අය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔවුන්ව සුව කලාය කියා පවසමින් ප්‍රතිකාර නොගෙන රෝහලින් පිටවී යනවා'' කියාය. පසුව වෛද්‍යවරයා මා හට රෝහලින් නිවසට යාමට අවසරය ලබා දුන්නේය. ශෛල්‍යකර්මයක් නොමැතිව වෙනත් කිසිම වෛද්‍ය ප්‍රතිකාරයක් නොමැතිව දෙවියන්වහන්සේගේ


**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**



The Chairman, Nehemiah Bible College, Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in

# MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines : English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikan.
3. **BIBLECOR** - Basic Bible Courses (English, Tamil & Hindi)
4. Nehemiah Bible Colleges (Three Centres) (Evening / Residential)
5. Theological Correspondence Courses: English & Tamil
6. Great Commission Partners (Network of Pastors)
7. Training Programmes
8. Crusades
9. Literature Distribution and Follow Up
10. Gospel Printing Press - Publications
11. St. Paul's Matriculation School - Village English High School
12. Sunday Schools : 10.30 a.m. & 4.00 p.m. Sunday
13. **Early Morning Service : 5.30 a.m. Sunday**
14. **Tamil Service : 8.30 a.m. Sunday**
15. **Youth Service : 11.00 a.m. Sunday**
16. **Fellowship Lunch : 12.30 p.m. Sunday**
17. **Travel to Mission Centres : 1.30 p.m. Sunday**
18. **Children Ministry : 3.00 p.m. Sunday**
19. **Hindi Service : 4.00 p.m. Sunday**
20. **Telugu Service : 5.00 p.m. Sunday**
21. **Telugu, Hindi & Telugu Service : 6.00 p.m. Sunday**
22. Women's Prayer : 5.30 p.m. Wednesday
23. Men's Prayer : 7.00 p.m. Friday
24. Discipleship Meeting : 6.00 p.m. Saturday
25. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
26. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
27. Ministers' Meeting : 6.00 p.m. First Saturday
28. Parents' Prayer : 4.00 p.m. First Sunday
29. Night Prayer : 9.30 p.m. Third Friday
30. Fasting Prayer : 9:30 a.m. Second Saturday
31. Holy Communion : Second Sunday Services
32. Youth / Kid Prayer : 10.00 p.m. daily
33. Staff Devotion : 9.00 a.m. daily
34. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

***8 පිටුවෙන්....***

බලය කරණකොටගෙනත් මා තුළ තිබූ ඇදහිල්ල කරණකොට ගෙනත් එදා දෙවියන්වහන්සේ මා හට සම්පූර්ණයෙන්ම සුවය ලබා දුන්නේය.

එවැනි භයානකවූ රෝගයෙන් දෙවියන්වහන්සේ මාව සුවකර දැනට වසර 36 කි. මට නැවත එම අමාරුව හෝ කැක්කුම නැවත ආවේම නැත. මා දිනකට පැය 20 ක් වැඩ කරමි. කාර්යාලයේම වැඩ කටයුතුත්, දේශනාවන් කිරීමත්, ආදී වැඩ කටයුතු ක්‍රමානුකූලව බෙදා ගෙන ඉටු කරමි. උන්වහන්සේගේ සුව කිරීමේ ආශිර්වාදය පමණක් නොව උන්වහන්සේ සෑම අංශයකින්ම මා හට ආශිර්වාද කර ඇත. අද වන විට දෙවියන්වහන්සේ මට බොහෝ මිත්‍රයින්ද දී තිබේ. අද මුළු ලෝ තලයෙහිම විවිධ ස්ථානයන්හි සිටින විවිධ විවිධ පුද්ගලයින් මගේ සේවය හා සම්බන්ධ වී ඇත. අද ඔවුන් මට ඉතා හොඳ මිත්‍රයින් ලෙස සිටිනු ඇත.

ප්‍රිය මිත්‍රවරුනි, මේ ලෝකයෙහි ඇති අඳුර මැද ස්වාමීන්වහන්සේ ඔබගේ ආලෝකය වී ඔබට මගපෙන්වන සේක. උන්වහන්සේව ඔබගේ සපයන්නා වෙමින් ඔබව ධර්මිශ්ඨවූ මාවත්වල ගෙනයන සේක. තවමත් ඔබ උන්වහන්සේව ඔබගේ ගැලවුම්කාරයා ලෙස පිළිගෙන නොමැති නම්, උන්වහන්සේගේ මඟපෙන්වීම තුල ඔබගේ ජීවිත ගමන ගමන් කරන්න. මට මගපෙන්වන්නාවූ මට ආශිර්වාද කරන්නාවූ මෙම දෙවියන්වහන්සේ සැබවින්ම ඔබටත් එසේම කරන සේක.

***යෙසායා 43:19 හි මෙසේ ප්‍රකාශ කරයි. ''....මම කාන්තාරයෙහි පවා මාර්ගයක්ද වනයෙහි ගංගාද සාදන්නෙමි''***

RNI NO. TN/SIH/2006/17846

## Echo of His Call

**YouTube**

Please subscribe

Kindly view and subscribe our **Echo of His Call YouTube Channel** when you get time. Thanks.

**- Editor**

....*Contd. from page 7*

මවෙක් ලෙස ඔබ ඔබගේ දරුවන් ගැන දෙවියන්වහන්සේට කන්නලව් කරන විටදී ඔවුන්ට උන්වහන්සේ අවශ්‍ය දේ සපයා දෙනවා පමණක් නොව ඔවුන්ගේ අනාගතය ගැන සැලසුම්ද දෙවියන්වහන්සේ දමයි. හාගර්ගේ දරුවාට දෙවියන්වහන්සේ වතුර ලබා දුන්නා පමණක් නොව ඔහුගේ අනාගතයේදී ඔහු කවුද වෙන්නේ කියා උන්වහන්සේ එළිදරව් කරනු ලැබුවේය.

*''නැගිට ළමයා ඔසවා නුඹේ අතින් අල්ලා ගනින්න. මක්නිසාද මම ඔහු මහත් ජාතියක් කරන්නෙමි.'' (උත්පත්ති 21:18)*

මව්වරුන් යාච්ඤා කරන විටදී අපගේ දරුවන්ගේ අනාගතය ගැන දෙවියන්වහන්සේ අපට දිව්‍යමය එළිදරව්වක් දෙන සේක. අපගේ දරුවන්ගේ අනාගතය ගැන දෙවියන්වහන්සේ අපට එළිදරව්වක් දෙන සේක. අපගේ දරවැන්ගේ කාරණාවන් වලට අප පිටතින් පිළිතුරු සෙවීම අවශ්‍ය නැත. අප යාච්ඤා කරන්නාවූ මව්වරුන් නම්, අපගේ දරුවන් ගැන අප යාච්ඤා කරන්නාවූ මව්වරුන් නම්, දරවැන් උදෙසා කඩුල්ලේ සිටගන්නාවූ මව්වරුන් නම්, දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක. එබැවින් අපි යාච්ඤාවේ මව්වරුන් වෙමු.

# ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

| Annual Subscription : Rs. 100/- | Life Subscription : Rs. 2000/- |
|---|---|

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

**ECHO OF HIS CALL**

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA

PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in

Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**

**Date of Publication: First week of every month**

**Date of Posting : 1st & 2nd of every month**

**Posted at "Egmore RMS / 1 Patrika Channel"**

on 2nd **MAY 2024.**

**If un-delivered please return to:**

**ECHO OF HIS CALL (SINHALA)**

**P.O. Box No. 2957,**

**Chepauk, Chennai - 600 005, INDIA.**

**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**